# පන්හිඳයි පින්සලයි



## සිසිර දිසානායක

# මුර දේවතා

''කොහොමද ඉතින් ජීවිතේ?'' පින්සල ඇහුවේ කාලයකින් මුලිච්චි වෙච්චි කෙනෙකුගෙන් අහන ප්‍රශ්ණයක්.
''ජීවිතේ මස් කඩේ කොක්කේ....'' පන්හිඳ ඇඟට නොදැනී කියලා දැම්මා.
''මොකක් දෑ අප්පේ ඒ හරුපේ තේරුම?'' පින්ට හිනා,
''දන්නෙම නෑ නේද? මස් කඩේ කොක්කට යන්නේ කවු?'' පන් බැරෑරුම් මුණක් හදා ගත්තා.

''හරක් ..........๑ '' පින්ට ඉබේම කියවුණා.
''අන්න හරි ๑ අනුන්ටම ජීවිතේ කැපකරන හරක් ๑''
''ඉතින් තමුන් හිතාගෙන ඉන්නේ තමුනුත් ඒ වගේ කියලද? මොකටද ඉතින් මගෙ කට ๑ ඒ තරමටම පරහිතකාමියා.'' ඉස්කෝලෙ යන කාලෙ යාලු මිත්‍රයෝ පින්ට ''කොකු මාටින්'' කියලා නමක් පටබැන්දෙ නිකම්ම නෙවි.

''අනේ මම එහෙම හිතල කිව්වා නෙවි. එහෙම අයත් නැත්තේ නෑනෙ අපි අතරේ.'' පන්ට ලැජ්ජා හිතිලා.
''ඒක මිසක් ๑ ඒත් සීයට සීයක්ම එහෙම වුණ අය නම්'' හොයා ගන්න ටිකක් මහන්සි වෙන්න වේවි.''
''අප - අප අතරේම අප - අප වෙනුවෙන්ම කැප වී කටයුතු කරන්නන් නැත්තේම නොවේ....'' පන් ලියන්නට වාඩි වුණා. ''ඔවුන් තමන්ගේ සමාජ උපකුලකය වෙනුවෙන් ගත කරනා කාලය, ශ්‍රමය කිසිවිටෙක මුදලින් තක්සේරු කළ හැකි වේද? සැබැවින්ම නැත. ගම් බිම්වලයාම් සහ විනෝද ගමන් නිසා-වෙන් මෙල්බර්න් නුවරින් බැහැර වුවන් නිසාම උඳුවප් හා දුරුතු දෙමාසයේ නිද්‍රාවට පත්ව හුන් කලා මංගල්‍යයන් නවම්, මැදින් වනවිට එක පිට එක ගලා එන්නා සේය. තමන්ගේ දේ ඇසුරින් තමන්ගේවුන්ට යමක් කිරීමට උනන්දුවන්නන්ගේ කටයුතු කීපයක් නිසාවෙන් පසුගිය සති කීපය කාගේ කාගේත් සිත් ප්‍රබෝධමත් වූ බව නිසැකය.

හුදී බොදු දනන් වෙනුවෙන් ඉදි කෙරෙන සමාධි බෞද්ධ භාවනා මධ්‍යස්ථානයේ ගොඩනැගිලි අරමුදල නැංවීම සඳහා වේදිකා ගත වුණ ''රටකින් එහා'' ප්‍රසංගය හැත්තෑව දශකයේ ගී රස විඳි රසිකයින්ගේ මන දොළ සපුරාලීය. සංගීතය සැපයූ ''තරංගා'' වාදක මණ්ඩලය වේදිකාවේදීම අගැයූ ප්‍රියා සූරිය-සේන ශිල්පියාණන්ගේ විශේෂ ස්තූතිය හිමිවුයේ එහි නියමුවා වන කැමරන් කොළඹගේ ශිල්පියාටයි. අපගේම දේ අපට හුරු ලෙසින් අපගේ සවනට ළං කරන්නා වූත්, ඒ හුරුව මතු පරපුරට දායාද කරන්නා වූත් කොළඹගේ සහෘදයා අපගේ ගී කලාව වෙනුවෙන් කැපවූවකු නොවේද?



මෙනුවර වාසී දුවා දරුවන් වෙනුවෙන් යමක් කිරීමට නිරන්තරව සැදී පැහැදී සිටින විනිතා විජේරත්න ලේඛිකාවගේ මූලිකත්වයෙන් පසුගියදා පැවැත්වීමට යෙදුණ ''ටිකිරි ළමා නාට්‍ය උළෙල'' ගීත නාටක හතරකින්ම අලංකෘත විය. ආනන්ද විද්‍යාලයේ හිටපු ආචාර්යවරියක වන මාලනී කුලතුංග කලාවේදිනියගේ රචනයෙන්, තනුවෙන්, පුහුණුවෙන් හා අධ්‍යක්ෂණයෙන් අපගේ දූ දරුවන් කළා වූ රංගනයන් ප්‍රේක්ෂක නෙතඟ කඳුලක් නංවන්නට සමත් නොවූවානම් අරුමයකි.''
බටනලා වාදනයෙන්, චිත්‍රයකින් කොනක් අල්ලලා පුංචි එවුන්ගේ වැඩේට සම්මාදම් වෙන්න පින්ටත් ඉඩක් ලැබුණා. පන්ටත් කාලයකට පස්සේ කවි දෙපදයක් ගැට ගහගන්න ඉඩක් ලැබුණා. දෙන්නාට හරි සතුටුයි.
ඕස්ට්‍රේලියානු රජයේ මූලිකත්වයෙන් කැන්බරා නුවර ප්‍රසංගයක් සඳහා ආරාධනා ලැබ සපැමිණි බටනලා සහ එස්රාජ් වාද්‍ය විශාරද ශාස්ත්‍රපති අනිල් මිහිරිපැන්න සංගීතවේදියාණන්ගේ මෙල්බර්න් සම්ප්‍රාප්තිය උත්තර භාරතීය ශාස්ත්‍රීය සංගීතය හදාරන්නන්ගේ මෙන්ම රසිකයින්ගේ සිතැඟි සපුරා ලූ අංගයක් වීය. රාගධාරී සංගීතයේ උත්තරීතර සියුම් වින්දනය සඳහා එවන් සංගීත සම්භාවනාවක් සංවිධානය කිරීමෙහි ලා මූලිකත්වය ගන්නා ලද්දේ ''සංඛ පද්ම'' සංගීත ආශ්‍රමයේ වාසනා වීරකෝන් සංගීතාචාර්යවරියයි. එතුමන් සෙවනෙහි බටනලා වාදනය හදාල රුක්මන් විමලසූරිය හා රංගන ශිල්පී ජය ශ්‍රී චන්ද්‍රජිත් කලාහිතකාමීන්ගේ සහය ඇය හට නොමදව ලැබිණ. නොයෙකුත් වින්දන රටාවන් අතරේ අයාලයේ යා නොදී සංගීතයේ මූලික හර පද්ධතීන්ගේ රුව ගුණ සිය සිසු සිසුවියනට පොවමින් වාසනා තමෝ උඩු ගං බලා පිහිනමින් සිටින්නීය.

ගෙවුණා වූ සති කීපයේ පැවැත්වීමට යෙදුණු කලා කටයුතු අතරින් දැවැන්තම ප්‍රයත්නය වූයේ රශිකා කුලසිංහ නර්තනාචාර්යවරියගේ මූලිකත්වයෙන් යුත් විශ්ව රංගායතනය අතිඋත්කර්ශවත් ලෙසින් දෙවන වරටත් වේදිකා ප්‍රාප්ත කළා වූ ''විශ්ව නර්තන රේඛා - 2007'' නර්තන පෙළහරයි. නර්තනය මතු නොව චිත්‍ර, සංගීතය මුල් කොටගත් සියලු කලාවන් ද, තාක්ෂණය ද එක සේ කලතා පෙළ ගැන්වූ නර්තනාංග සාම්ප්‍රදායික හා නිර්මාණාත්මක අංගයන්ගෙන් මෙන්ම ඒවායේ සම්මිශ්‍රණයන්ගෙන් ද මනා සේ ගැලපී පොහො සත් වීය. රශිකාවෝ මේ වේදිකා ගැන්වූයේ අපගේම දරු දැරියන් එකසිය පනහකගේ කුසලතාවන් නොවේද?
ආචාර්යවරියගේ, සිසු සිසුවියන්ගේ මතු නොව ඊටම කැපවුණා වූ දෙමව්පියන් හා කලාකාමී හිතවතුන්ගේ අප්‍රතිහත ධෛර්යයත්, කැප වී කලා වූ පුහුණු අභ්‍යාසයන් පෙළත් බෝර්වුඩ් හි ''බීසන් සෙන්ටර්'' රංග වේදිකාව ආලෝකමත් කළා සේ වීය. ඒ සා විශාල පිරිසක්, වෙසෙසින්ම බටහිර ගති පැවතුම් තුළ කිමිදී ගත්, දරු දැරියන් පෙළක් විනයානුකූලව හසුරුවා ගැනීමම ආශ්චර්යයක් නොවන්නේද? එය ප්‍රසංගය දිනයට පමණක් ම සීමා වුයේ නොවේ. සෑම පුහුණුවන දාකදීම ඒ වෙනුවෙන් විශේෂ අවධානයක් යොමු වීය. රශිකාවන් වටා රොද බැඳගත් කලා හිතකාමී දෙමව්පිය මිත්‍රාදීන්ගේ නොමසුරු දායකත්වය පිළිබඳවද සැකෙවින් හෝ සටහන් තැබිය යුතුව ඇත්තේ වේදිකාව පසුපසින් වූ සංවිධානාත්මක බව සාමූහිකත්වයත් අගැයිය යුතු නිසාවෙනි.

''ගාමිණීගේ වැඩේ ගැන පොඩ්ඩක්....'' පින්ට ඉවසිල්ලක් නෑ. තමන්ට දැනුණ දේ ගැන පන්ට කියලා මොනවා හරි ලියවා ගන්න.
ගාමිණී රණසිංහ කලාකරුවාණන් අතින් නිමාවුණ අති විශාල පසුතල නිර්මාණ හුදෙක් චිත්‍ර ශිල්පයට පමණක් සීමා නොවීය. විටින් විට ඉදිරිපත් කරන අංගයන්ට අනුව එකම පසුතලයක් ඇසුරින් නිර්මිත විවිධ දර්ශන තල වෙනස් කිරීමට යොදා ගෙන තිබූ ක්‍රමවේදය ගාමිණීගේ පරිකල්පන ශක්තිය මනාව කියා පෑවේය. වේදිකා පරිපාලනයද ඔහු අතින්ම ඉටු වීය. සියලු ඇඳුම් නිර්මාණය රශිකාවන්ගේම විය. පැතුම් තිලකසිරි සහ රශ්මි වීරසිංහ නිවේදක නිවේදිකාවන්ගේ සුපුරුදු හඬින් පෙළ ගැන්වුණ ප්‍රසංගයේ සම්බන්ධීකරණය රෝහණ කස්තුරිරත්න ගෙනි. ජගත් කොතලාවලගේ පළපුරුදු දැනුමෙන් ආලෝක කරණයත්, අරුණ කුලසිංහ සහ අරුණ අබේරත්නගේ ශබ්ද පරිපාලනයත්, අජිත් සිල්වා ප්‍රමුඛ පිරිසගේ වේෂ නිරූපනයත්, තුසිත කුලසේකර සහ ජානක විජේසේකරගේ සංගීතයක්, ශ්‍යාමලී වේරගොඩ සහ ලක්ෂ්මන් ගමගේ ගේ ගායනයත්, වරුණ මල්ටිමීඩියා ආයතනයේ වීඩියෝ කරණයත් මධ්‍යයේ දූ දරුවන්ගේ හපන්කම් මොනවට රඟ දැක්විණ. ලී කෙළියේ දී ගෙතුණා වූ රටාවන් කුඩා දරුවන් තුළින් මෙල්බර්න් නුවරට හඳුන්වා දුන් නැටුම් අංගයක් වීය. සියලුම නර්තන අංග එකිනෙකට දෙවැනි නොවුවා සේය. අපගේ හැදියාවන් සුරකින්නා වුත්, සුරැකීමට අත හිත දෙන්නාවූත් මුර දේවතා පෙලක් නොවෙයිද මේ?''

පන්ගේ අතින් ලියවුණ ''නුඹෙ සිරික්කියට'' ගීතයටත් රශිකා අපූරු නැටුම් නිර්මාණයක් කරලා තිබුණා. සේනානායක වේරලියද්ද නර්තන ශිල්පියා සංගීතවත් කරලා ජානක වික්‍රමසිංහ ගායන ශිල්පියා ගායනා කළ මේ ගීතය ලංකාවේ කාලයක ඉඳන්ම ජනප්‍රිය වෙලා තියෙන කතා බහට ලක්වුණ ගීතයක්.
ආනන්ද විද්‍යාලයේ ආදී ශිෂ්‍ය සංගමයේ වික්ටෝරියානු ශාඛාව මගින් කෘතවේදීව කළ යුතුකම් දෙකක් පිළිබඳවද සටහන් තබනුයේ අගැයිය යුතු දේ අගැයිය යුතුවන නිසාවෙන්මය. විද්‍යාලයේ සංගීතාචාර්යවරයකු වූ අනිල් මිහිරිපැන්න ශූරීන් වෙනුවෙන් රාත්‍රී භෝජන සංග්‍රහයක් සංවිධානය කොට තුටු පඬුරින් බුහුමන් දැක්වූ ඒ හැඟුම් බර මොහොත එතුමන්ගේ මතු නොව රැස්ව සිටි සැමගේ නෙත් කෙවෙහි තෙමාලන්නට සමත් විණ. එම සාදය නිමාවුයේ සරත් විමලවීර ශූරීන් විසින් නිබන්ධනය වී මිහිරිපැන්න ඇදුරිඳු අතින් නිර්මාණය වී අදටද ආනන්දයේ සිසුන් මුවින් දිනපතා ගැයෙන ''ආනන්දයි - ආනන්දයි, ආනන්දේ හද ආනන්දයි'' ගීය සියලුම ආනන්දයීයන් විසින් ගැයීමෙනි. දිවයිනේ මුල්වතාවට ''ගුරු උපහාර උළෙලක්'' සංවිධානය කළ ආදී ආනන්දයීයෝ අද වනවිට එය වාර්ෂිකව ඉතා උත්කර්ෂවත්ව හා හරවත්ව පවත්වන්නෝය.

මෙල්බර්න් කොන්සර්ට් ශාලාවේ මීට වසර කීපයකට පෙර රසික ප්‍රේක්ෂකයින් 25000 කට අධික පිරිසක් ඉදිරියේ වේදිකා ගතවුණ ''රන් ස්වර දහරා'' ප්‍රසංගයට සහභාගී වූ සියළුම මෙරට ශිල්පී ශිල්පිනියන් හට ආරාධනා කොට ඔවුනට ගෞරවාදරය දක්වන්නට ආදී ආනන්දයීයන් පෙළ ගැසුනේ එම ප්‍රසංගයේ දර්ශන තැටිය එළිදැක්වීමේ උළෙල අවස්ථාව කොට ගෙනයි. එවකට සභාපතිවරයා වූ රෝහිත බෝගහවත්ත සහ ප්‍රසංගය සංවිධානය කළ හර්ෂ ජයලත් බණ්ඩාර ප්‍රමුඛ සැවොමද අගැයුමට ලක්විණ.

ලියකියවිලිවල වැඩවලට අමතරව කලා අතේ වැඩකට ඉස්සරවෙලාම පින් ආරාධනා ලැබුවෙ ''රන් ස්වර දහරා'' ප්‍රසංගයේ වේදිකා පසුතල නිර්මාණය කරන්න සුමිත් ගුණතිලක කියන පන්ති මිත්‍රයාට එක්වෙන්න. ආදි ශිෂ්‍යයෝ විදියට සුමිත්ට එක් වෙලා පටන් ගත්ත ඒ කලා කටයුත්ත පන්ටත් පින්ටත් අමතක නොවෙන අත්දැකීමක් වුණා. පින්තාරු වැඩ කරන කොට රතු තින්ත පැල්ලමක් වැදුණ නිල් ඩෙනිම් කලිසම පින්ට අදටත් ඒ මංගල කටයුත්තේ සිහිවටනයක්.

■

ඔබේ මුදල්
ශ්‍රී ලංකාවට
පහසුවටත්
ඉක්මනටත්
යවන්න
සූරිය මාකටින් සර්විසස්
සූරිය SOORIYA
AFS
CASH 2 HAND
සමගින්
22 Lorne Street Lalor Vic 3075 Tel : 9402 5380 Melway 9B6

ඔබ කනස්සල්ලෙන් ද..? පසුතැවිල්ලෙන් ද..?
ඔබට විශ්වාසදායක උපදේශක සේවාවක් අවශ්‍යයි ද?
එසේ නම්
ඔස්ට්‍රේලියානු උපදේශක සංගමයේ ලියාපදිංචි සාමාජිකාවකගෙන්
එම උපදේශක සේවය ලබාගැනීමට දැන්අවස්ථාව ඇත
- සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම සේවය
- පහසු අයකිරීම්
ශ්‍රී ලාංකික ඔබ සඳහා විශේෂයි
MPS Counselling Service
Shiromi Perera (MACA)
Mast. Couns, Grad Dip Couns, BSc
CLINIC
20/215 Betula Ave
Mill Park VIC 3082
Tel: (03) 9436 6965
Mob: 0448 829 905
Email : shiromi.p@optusnet.com.au
ACA AUSTRALIAN COUNSELLING ASSOCIATION
REGISTERED MEMBER OF THE AUSTRALIAN COUNSELLING ASSOCIATION

VCE
Chemistry & Biology
&
Junior Levels Maths
Tuition
(Northern Suburbs)
offered by a
Qualified & Experienced Teacher
Call Sandya on 9437 7801
Mobile 0402 503 398